# ශ්‍රී ලංකාවට ආර්ථික සංවර්ධනයක් ළඟා කර ගැනීමට රජය දිය යුතු දායකත්වය

*ඒ. කේ. ඩී. ටී. පෙරේරා* [1]

**සංක්ෂේපය**

ආර්ථික සංවර්ධනය යනු, රටක නිමවුමේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනය වීමයි. න්‍යාත්මක වශයෙන් ගත්කළ සාක්ෂරතා අනුපාතය, ආයු අපේක්ෂාව, දරිද්‍රතා අනුපාතය වැනි විවිධ වූ දර්ෂකයන් ඇසුරින් රටක ආර්ථික සංවර්ධනය නිර්වචනය කල හැකිය.ආර්ථික සංවර්ධනය අධ්‍යයනය කරන ලෝක බැංකුව ශ්‍රී ලංකාවේ සංවර්ධනය පිළිබඳ ඇගයුම ශ්‍රී ලංකාව තීරණාත්මක සංධිස්ථානයක පසුවන බව සඳහන් කරයි.තිස් වසරක යුද්ධය, පාස්කු ප්‍රහාරය හා වර්තමානය වන විට පවතින කොවිඩ් - 19 වසංගතය හමුවේ දශක 09 කට පසු මුහුණ දීමට සිදු වූ බිඳ වැටුණු ආර්ථිකයේත් සියලුම අංශයන් නැවත ඉහළ මට්ටමකට ඔසවා ගැනීමට රජය දක්වන දායකත්වය සම්බන්ධයෙන් ගැටලුවක් ගොඩනැගී ඇත.මෙම පර්යේෂණය ද්වීතියික දත්ත මත පදනම් වූ විස්තරාත්මක පර්යේෂණයකි.මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනයට රජය විසින් ලබා දිය යුතු දායකත්වය පිළිබඳ විග්‍රහයක් කිරීමයි.මෙම සමීක්ෂණයට අනුව රජය විසින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අභිමතාර්ථ මත පදනම් වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නාගරික වෙළෙඳපොළ හා ක්‍රියාකාරී නීති පද්ධතියක් රජය විසින් ඇති කිරීම, බදු සහන හා ඉන්ධන ලබා දීම, අවදානම් කලමනාකරණය හා නව ආර්ථික අවස්ථා උත්පාදනය, පෞද්ගලික ආයෝජන හා අපනයන මුල් කරගත් ආර්ථිකයන් ඇති කිරීම ආදී කරුණු රටක් වශයෙන් ආර්ථික සංවර්ධනයක් කරා ගෙන යාමට සුදුසු වන බව හඳුනාගැනීමට හැකිය.ඒ අනුව මෙම අධ්‍යයනය තුළින් ආර්ථිකමය වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කරවීමට කටයුතු කරන රජයේ නිලධාරීන්ට මෙම කරුණු අනුව සංවර්ධනය ප්‍රතිපත්ති ගොඩනැංවිය හැකි වනු ඇත.

**මූඛ්‍ය පද:** *ආර්ථික සංවර්ධනය, සංවර්ධන වැඩසටහන්, රජයේ නිලධාරීන්*

[1] diltharushika96@gmail.com, ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය